

# මරණයෙන් පසු කුමක්ද?

ප්‍රෙඩ් පියර්ස්

**[AFTER DEATH WHAT?]**

# මරණයෙන් පසු කුමක්ද?

ෆ්‍රෙඩ් පියර්ස්

# පටුන


මරණය සත්‍යයක්

මරණින් පසු ජීවිතය 3

මළවුන්ගෙන් පණිවිඩයක් 4

ජීවිතය පිළිබඳ ප්‍රශ්න 5

පිළිතුර 6

බයිබලය සහ අප 6

මරණය පැමිණීම 7

මිනිසා සහ සතුන් 8

දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් මිනිසා 9

මරණයේ නින්ද 9

යේසුස්වහන්සේ අපෝස්තුළුවරුන් සහ පැරණි ගිවිසුම 10

මළවුන් නැගිටීම 12

නිරය 13

ගිහෙන්න 14

ආත්මය 34

පොහොසත් මිනිසා හා ලාසරස් 36

කුරුසිය මත සොරා 39

වධාත් ප්‍රචලිත වූයේ ඇයි ? 45

ප්‍රශ්න 51

# මරණයෙන් පසු කුමක්ද?

## මරණය සත්‍යයක්

මරණයේ සත්‍ය ස්වභාවයයෙන් ගැලවීමක් නැත. හදිසි අනතුරකින් හෝ හෘදයාබාධයකින් හදිසියේ ක්ෂණිකව මරණය සිදුවේ. එවිට අප කම්පනය වේ. වකුගඩු දුබලතාවයකින් හෝ පිළිකාවකින් යමෙක් ජීවිතයේ මුල්කාලයේ මිය යාද, එවැනි දේ අප හට සාමාන්‍ය අත්දැකීම්ය. අපේ අසරණ භාවය නිසා ඒවා අප කෙරෙහි පැමිණේ. එවැනි දේ අප හට වැලැක්විය නොහැක. මළ මිනිසෙකුට යළි ජීවිතය දිය හැකි උපක්‍රමයක් මිනිසාට නැත්තේය. වැළපෙන ඥාතීන් සැනසීම පහසු නොවේ.

මරණය පිළිබඳ මිනිසා ගන්නා ප්‍රතික්‍රියාව කුමක්ද? ඇත්තෙන්ම කළ හැකි කිසිවක් නැත. නිදසුනක් වශයෙන් මිතුරෙකු මාර්ග අනතුරකින් මියයාමේදී, අවස්ථානුකූලව ඇතිවන කම්පනය අනුව, එය අවාසනාවක් යැයි කියති. සිද්ධිය වහා අමතක වී යැයි කියති. සිද්ධිය වහා අමතක වී යයි. මැදිවියේ අය එම වයසේදී මිය යෑමට කැමති නැත. අවදානම තව බොහෝ ඇත යම් මරණයකට පැමිණෙන විට එයින් ගැළවිය නොහැකි බව තේරුම් ගැනීමෙන් බොහෝ ඈත්ව සිටීමයි. ඔවුන්ගේ නෑදෑ හිතවත්තු වෙන්ව යති. ඇස් පෙනීම ඇසීම හා ශාරීරික දුබලවීම් ඇතිවන විට මිනිස් සිරුර විනාශවන බව නැවත සිහිවේ.

## මරණින් පසු ජීවිතය

බොහෝ දෙනා නොනැසී පවතී යන අදහස ඇතුව සිටිති. ගුප්ත අභ්‍යන්තරික ජීවිතය යැයි කියන “ආත්මය” ශරීරය විනාශ වන විට එයින් ඉවත්ව ස්වර්ගයට ගොස් නොකඩවා සැප විඳින්නේය යන අදහස ඇතුව සිටිති. මේ අදහස රහසිගත වූවක් හෝ වරක් පැතිර තිබුන සේ ව්‍යාප්තවූවක් නොවන මුත් ලෝක සම්මත වශයෙන් ප්‍රබල එකකි. එය නොපැහැදිලි වූවකි. සැම නත්තල් දිනක දිම සවස කේම්බ්‍රිජ් රාජකීය විදුහලේ ප්‍රසිද්ධ දේශනා හා යාච්ඤා පැවැත්වේ. එහිදී, “අප සමඟ සම්බන්ධව ප්‍රීතිවන  අනික් ඉවුරක

මහත් ආලෝකයක වසන්නෙනි" යයි අමතන ප්‍රධානියා අදහස් කරන්නේ මියගියවුන්ය. මේ "මහත් ආලෝකය" "අනික් ඉවුර" කුමක්ද? යන්න අපහට අසන්නට වී නම් අපට නිසැකවම එය කොහේවත් විය නොහැකි යැයි පිළිතුරක් ලැබෙනු ඇත. බලාපොරොත්තුව පැහැදිලි නැත. කතෝලික පල්ලිය මේ අදහස පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය සේ සලකන මුත් අද අන්‍යයන් මෙය බැහැර කරන්නකි. කතෝලිකයන් නපුරු මිනිසුන්ගේ ආත්ම මරණින් පසුව අපායට ගොස් නිරන්තරව වධ විඳින්නේය යන අදහස ව්‍යාප්ත කරයි. කතෝලික පල්ලිය පාරාදිසය, ශුද්ධ ගිනි ස්ථානය, නිරය අපාය පිළිබඳ අදහස් දරයි. මෙහිදී පිළිගත හැකි වැදගත් කරුණක් ඇති බව කිව යුතුය. එනම් දැහැමියන්ගේ ආත්ම ස්වර්ගයට යන්නේ නම් නපුරු ආත්ම යන්නේ කොතැනටද යන්නය.

සර්ව අශුභවාදීන් අද සැලකිය යුතු පමණ වැඩිවී ඇත. ඔවුනු ජීවිතයේ අවසානය මරණය ලෙස පිළිගන්නෝය. "මගේ ජීවිතය නැති වුවාට කම් නැතැයි" යමෙක් කිය. මෙය අවාසනාවන්ත අදහසකි. එය දරණ පුද්ගලයා සමහ තදින් විවාද කළද ජීවිතය යනු ඔහු සතු සියල්ලම වේ. එය ඔහුගේ කැමැත්ත කරගැනීමට හැකිය. ඔහු හොඳින් කා බී සතුටු විය. මන්ද ඔහු හෙට මිය යන්නේය. මේ අදහස කරුණාවෙන් ජීවත් වීමට ඇති අදහසට බරපතල අයහපතක් ඇති කරයි. මෙය තමාගේ කැමැත්තට ඉඩ දීමක් හෝ තමා මධ්‍ය කරගත් දෙයකි. අප අද දකින සමාජ ආපදාව මෙයයි.

## මළවුන්ගෙන් පණිවිඩයක් ?

ඉතිහාසය ආරම්භයේ සිටම ජීවත් වූ ප්‍රකෝටි ගණන් මිනිසුන් මියගොස් වළලනු ලැබ ඇත. ඔවුනු නොකඩවා යම් අළුත් මුහුණු වරකින් සිටි නම් ඔවුන්ගේ තොරතුරුද ස්වභාවය ද දැන ගැනීමට හැකි නම්, නැතහොත් ජීවත් වන්නවුන්ට ඔවුන්ගෙන් යම් අවවාදයක් ඔබ බලාපොරොත්තු නොවන්නේද? නමුත් කිසි දින කිසිවෙක් ඔවුන්ගෙන් පණිවිඩයක් හෝ වචනයක් ලැබුවේ නැත. මෙය පුදුමයක් නොවන්නේද? කෝටි ගණන් මිය ගියවුන් සිටින්නේ කොහේද ?

නොකඩවා පැවැත්ම විශ්වාස කරන මළවුන්ගෙන් පණිවිඩ අපේක්ෂා කරන ආත්මවාදීන් පිරිසක් ඇත. නමුත් පරීක්ෂණ මගින් හෙළිවී ඇත්තේ මෙය කොතරම් අපහසුද යන්නයි. වසර ගණනාවකට පෙර මෙය ලියන්නා බොහෝ පුළුල් ලෙස මේ කාරණාව අදාළව ලිපි ලේඛන කියවන ලදී. මළවුන්ගේ පණිවිඩ කෙසේවත් නොවූ අතර "ආත්මයක්" ඇති බව පැහැදිලි නොවීය.

ජීවිතයෙන් පසුව සුවඳමල් වතු පළතුරු උයන් ජලාශයන්හි දිව්‍ය සැපතින් සතුටු වීම පිළිබඳ අදහස් ඒවායේ පුරවා ඇත. තරමක් පැහැදිලිවූ දේ නම් මිනිසාගේ සිතේ කල්පවත්නා හැඟීම් පමණක්ය යන්නයි. මානසික පර්යේෂණ විශේෂ වශයෙන් පවත්වන C.E.M ජෝඩ්, ආත්මයන් ගේ තත්වයන් පිළිබඳව දැඩි ලෙස පවසන්නේ අපේ ආත්මයන් නොකඩවා පවතින්නේ නම් මොළය කොහෙත්ම නොපවතින බවයි. ඉදින් ඒ පිළිබඳව අනුකම්පා ඇතිවේ. සමහර ස්ත්‍රීන් හා පුරුෂයින් වටිනා ජීවිත ගතකරත්, ප්‍රියලෙස කටාකිරීම පරෝපකාරය බුද්ධිමත්වූ කාරුණිකව හැසිරීම කරන අතර සමහර අය ඒ ඒ ක්ෂේත්‍රයෙහි ඉගෙනුම ලබා පුහුණු වන්නේය. සදා කාලයටම නැතිව යන්නේ නම් මේ දේවල් අවශ්‍ය වේද? ඉදින් මේවාට වටිනාකමක් නොවේ නම් ජීවිතය අවසානය දක්වා හොඳ චරිතයකින් සිටීමේ නියම වටිනා කමක් තිබේද? නිතැතින්ම නගන ප්‍රශ්නයක් වන්නේ නියම වටිනාකම කුමක්ද? යන්නය. අප පසුව ඒ ගැන බලමු.

## ජීවිතය පිළිබඳ ප්‍රශ්න

මරණයෙන් පසු වන්නේ කුමක්ද? යන්න අප විසඳාගන්නේ කෙසේද? සාධාරණ සත්‍ය පිළිතුරක් සඳහා අප කුමක් කළ යුතුද? අප අපේම හැඟීම් විශ්වාස කරනවා ද, අන් අයගේ අදහස් ගන්නවාද? අප නිවැරදි දැයි කෙසේ දනිමුද? අන් අය අපේ අනුමැතියෙන් අපේ අදහස් ගනී යන්න කෙසේ බලාපොරොත්තු වෙමුද? කොහේදී කොයි මිනිසා ගැහැණිය අපට පිළිතුරු දේද? ඔවුහු කෙසේ දනිද්ද? අප ආගමික නායකයන්ගේ අදහස් ගනිමුද? විචාරකයින්ගේ දේව ගැතියන්ගේ සම්මුතින් පිළිගනිමුද? ප්‍රධාන ආගමික නායකයින් ඔවුන් අතර වැදගත් කරුණු පිළිබඳව භේද භින්නව සිටිති. එක් ප්‍රධාන බිෂොප් වරයෙකු කීවේ යේසුස් වහන්සේ සිරුර පිටින් උත්තානය නොවූ බවයි. අන්‍යයන් පවසන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ උත්තානය එක්තරා මූලික පදනමක් සහිත ක්‍රිස්තියානි විශ්වාසයක් බවයි. මෙයින් අප විශ්වාස කරන්නේ කවුරුන්ද, කුමක්ද?

මේ ප්‍රශ්නයට සුහදව මුහුණ දීමේදී අපට නොගැලවිය හැකි නිගමනයකට පත්වේ. තමාගේ සිත උපදේශක වන බවත් අන්‍යයන්ගේ අදහස් තුළ තවදුරටත් වටිනාකමක් නැති බවත්ය. මිනිස් අදහස් අපට පිළිතුරු දීමට සමත් නොවේ.

මෙයින් ඉතා වැදගත් නිගමනයකට එළඹිය හැක. මරණයෙන් පසු කුමක් වේද? යන්න හැඳින්වීමට මිනිස් මොළය සතු බලයක් නැත. මිනිස් වර්ගයාට බාහිරව ඉහළින් පැමිණෙන බලයක් ඊට අවශ්‍යවේ. එය අධි මානුෂික බලයක් විය යුතුය.

## පිළිතුර

එවැනි බලයක් එළිදරව්වක් අප සමඟ ඇත. මුල සිට අග දක්වා බයිබලය මගින් දෙවියන් වහන්සේ මිනිසාට දෙන පණිවිඩය එයයි.

බයිබලයේ ලේඛකයන් කිසිදිනෙක තම අදහස් කථා නොකළ අතර, දෙවියන් වහන්සේගේ වචනය, ප්‍රකාශ කළහ. "මම මගේ වචනය නුඹේ මුව තුළ බහාලමි." ජෙරමියා අනාගත වක්තෘ මගින් දෙවියන් වහන්සේ එසේ ප්‍රකාශ කලහ. (ජෙරමියා 1- 10)යේසුස් වහන්සේ ශුද්ධ ලියවිලි හා දිවැසි වරු සමඟ එකඟ වූහ. (අපේ පැරණි ගිවිසුම ) දේව වචනය පරිදි ඔහු ප්‍රකාශකළේ දෙවියන් වහන්සේගේ වචනයයි. අපෝස්තුලු පාවුල්තුමා ප්‍රකාශකළේද එයමයි. "දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත්, තරවටුවටත්," දුන් සේක. එසේම ශුද්ධ ලියවිලිවල ඇති දේ සත්‍යයය. අපෝස්තුලු වරුන් පෞද්ගලිකව දන්නා මුල්කාලීන ක්‍රිස්තු භක්තිකයන් පැරණි හා නව ගිවිසුම් දේව වචනය ලෙස පිළිගත්හ. සියවස් ගණනාවක්ම බයිබල් ඉගැන්වීම් ක්‍රිස්තියානි විශ්වාසිකයින් සඳහා පදනම් විය.

බයිබලයෙන් කරන්නේ කුමක් දැයි සලකා බැලිය යුතුය. මිනිස් වර්ගයාගේ පැවැත්ම නපුරුකම දුක හා මරණය ලෝකයට ඇතිවූ සැටි වාර්තා විස්තර කරයි. මරණින් පසුව සිදුවන්නේ කුමක් දැයි අපට පැහැදිලි කරයි. අප එහි පණිවිඩය පිළිබඳ උනන්දුවක් දක්වන්නේ නම් අපට ලැබෙන නව මාදිලියේ ජීවිතය පිළිබඳවද එළිදරව් කරයි.

මේ සියල්ල දක්වන වෙනත් කිසිදු පොතක් ලෝකයේ නැත්තේය. ඇත්තෙන්ම මෙය මිනිස් මනසකින් ඉදිරිපත් කළ පොතක් නොවන බවටත් දිව්‍යමය මනසකින් ඉදිරිපත්කරන ලද්දක් බවටත් බොහෝ සලකුණු එහි දැකිය හැක. වසර 100කට පෙර හෙන්රි රොජර්ස් විසින් සැලකිය යුතු පොතක් ලියන ලදි. "සුපර් හිරිපින් ඔෆ් ද බයිබල් ඩෙඩියුස් ෆ්‍රොම් ඉට්සෙල්ෆ්" යනුවෙන් එය නම් කර ඇත. මිනිසාට බයිබලය හා සම පොතක් ලිවිය නොහැකි යැයි ද හැකි වුවත් ඔහු එවැන්නක් නොලියයි යනුවෙන් එහි පවසයි. එසේ කීමට කාරණය එය දෙවියන් වහන්සේගෙන් අපට ලැබෙන පණිවිඩය නිසාය. එනිසාම අපගේ අතිමහත් උනන්දුව ඒ සඳහා යෙදවිය යුතුව පවතී.

## බයිබලය සහ අප

අපේ හටගැන්ම හා ස්වභාවය පිළිබඳව කීමට බයිබලය තුළ ඇත්තේ කුමක්ද? යන්න අවබෝධ කරගැනීම ඉතා වැදගත්ය. අපගේ පැවැත්ම, පැමිණි සැටි සඳහන් කිරීම එහි ඇති එකම බලයයි.

උත්පත්ති පොත අපගේ හටගැනීම ගැන සඳහන් කරයි. මිනිසා මවන ලද බව එහි පැහැදිලි කරයි. ඔහුගේ ජීවිතය මැවුම්කරු මත පදනම් වූ බව සිතිය යුතුය.

"ස්වාමි වූ දෙවියන් වහන්සේ මහපොළවේ දූවිල්ලෙන් මිනිසා සකසා ඔහුගේ නාසයට ජීවන හුස්ම පිම්බ සේක" එහෙයින් මිනිසා ජීවමාන සත්වයෙකු විය." (උත්පත්ති 2-7)

මිනිසාගේ පහත් හට ගැනීම මහ පොළොවෙන් බව දැනුම් දෙයි. ( උත්පත්ති 6-17 හා 7-21) මිනිසාට මෙන්ම තිරිසන් සතුන්ටද "ජීවන හුස්ම" හිමිය. බයිබලය වටහා ගැනීමට අතවශ්‍ය කොන්දේසියක් මෙම "ජීවත්වන ආත්මය" නම් ප්‍රකාශයක් තුළ ඇත. අප බයිබලය හා එහි ඉගැන්වීම් අපට අවශ්‍ය විදියට නොව ඒ අයුරින් උගත යුතුය. බොහෝ දෙනෙකු කල්පනා කරනුයේ "ජීවත් වන සත්වයෙකු" යන්න නොනැසී පවතින යම් ආත්මයක් මිනිස් සිරුර තුළ ඇති බවය. නමුත් එබන්දක් කොහෙත්ම නැත. එය උත්පත්ති පොතේ ආත්මය වශයෙන් පරිවර්තනය කර ඇත්තේ මිනිසාට පමණක් නොව සතුනටද එක ලෙසයි. උත්පත්ති පොතේ 1-21-24 හි එය "ජීවත්වන සත්වයෙකු" ලෙස පරිවර්තනය කර ඇත. ප්‍රති සංස්කෘත පිටපතේ එය "ජීවත් වන්නෙකු" ලෙසද යොදා ඇත. අවසානය පැහැදිලිය. මිනිසා උපතින් හා ස්වභාවයෙන් ජීවත්වන ප්‍රාණයකු ලෙස මවා ඇති බැව් උප්පත්ති පොත අපහට ප්‍රකාශ කරයි. නිසැකව ඔහුට සතුනට වඩා මානසික බලයක් හිමිය. නමුත් මූලිකව ඔහුගේ ස්වභාවය සතුන් හා සමානය.

## මරණය පැමිණීම

මිනිසාගේ අවසානය පැමිණෙන අයුරු උත්පත්ති පොත ආරම්භයේම පෙන්වයි. ආදම් ඔහුට දෙවියන් වහන්සේ විසින් දෙනලද අණපනත් කඩකල විට ඔහු මිය යන බව දෙවියන් වහන්සේ විසින් කියන ලදි. ඔහු අකීකරු වූ බැවින් ඔහුට ප්‍රකාශ කරන ලද දඬුවම මෙය විය. "නුඹ දූවිල්ලට හැරී යන තුරු මුහුණේ දහඩියෙන් යුතුව කෑම කන්නේය. මක්නිසාද නුඹ පොළොවේ දූවිල්ලෙන් ගන්නා ලද හෙයිනි. නුඹ දූවිලිය නුඹ දූවිලිවලට හැරී යන්නේය."(3-19) මරණය යනු නව ජීවිතයක ආරම්භය නොව අකීකරු වීම විනිශ්චය කිරීමකි. මිනිසා මහපොළොවට හැරී යයි. එහෙයිනි. උත්පත්ති පොත ගංවතුර වාර්තා කළේ: "මහපොළොව දෙවියන් වහන්සේ ඉදිරියේ නපුරුව තිබුණේය. අපරාධයෙන් පිරුණේය........ මහපොළොව මත සියළු මාංශය දෙවියන් වහන්සේගේ මාර්ගය නපුරට හැරවිය. (6-11-12) ගංවතුර විනිශ්චය පැමිණියේය. මිනිසා හා සතුන් සමාන ක්‍රමයට විනාශවිය.

"මහපොළොව මත හැසුරුන සියළු මාංශය නැසින පක්ෂීන් ද සිව්පාවුන් හා මාංශයින් ද.............. සියළු මිනිසුන්ද පිවන හුස්ම තිබූ සියල්ලන්............... මළෝය." (7-21-22)

## මිනිසා සහ සතුන්

බයිබලය නිතර මිනිසාගේ හා සතුන්ගේ සම්භවය සමකරයි. මෙය පැහැදිලි කරමින් ගිතිකා වල "දෙවියන් වහන්සේ ඔවුන්ගේ හුස්ම අහක් කළ සේක. ඔවුහු මළාහුව දූවිල්ලට හැරි," (104-29) ඉක්ලිසියස් ගත්කරු තරමක් වෙනස් සවරූපයෙන් "දැකිමට ඔවුහු මෘගයෝය. මිනිසුන් වැටෙන විට ඔවුහු වැටෙන්නේ එක් දෙයක් වැටෙන්නාක් මෙනි. එකෙක් නසින විට අනිකාද නසී. මෙන්න ඔවුන් සියල්ලෝම එක හුස්ම ඇත්තෝය............ සියල්ලන් එක තැනකට යන්නාහුය. සියල්ලෝම දූවිල්ලය. ඔවුහු දූවිල්ලට යති." (3-19-21) ස්වභාවයෙන් මිනිසා හා සතුන්ගේ ඉරණම එකය. ඔවුහු සියල්මලෝ මහපොළොවට හැරෙත්. ඊළඟ පදය තරමක් වෙනස් අදහසක් ගෙනේ. ප්‍රතිසංස්කෘත, නව ඉංග්‍රිසි බයිබල් එය මෙසේ යොදා ඇත.

"මිනිසාගේ ආත්මය ඉහළට යන්නේද කියාත් සතුන්ගේ ආත්ම පහල මහපොළොවට යන්නේ දැයි කවුරු දනිද?" (22 පදය)

එහි යම් වෙනසක් ඇත්ද කියා කාහට කිවහැකිද? වෙනසක් නොමැත. සියල්ලන් යන්නේ එක තැනටය. පොළොව හෝ මිනි වළවල්වලටය. "ආත්මය" වන බව හදිසියේ යෙදුනි. ඒ සමානව "හුස්ම" යන්නද යොදා ඇත. ගිතාවලි 19 ආත්මය මෙහි "ජිවිතය" "හුස්ම ගැනීම" සේ යෙදින. එය හුස්ම නැවතිමෙන් අවසන්වේ.

එසේ හෙයින් ආත්මය මිය යා හැක." අහංකාර ඊජිප්තුවරුන්ට දෙවියන් වහන්සේ පැමිණිනු දස විධ විපත් පිළිබඳව ගිතාවලි මෙසේ කිහ. "ඔහු (දෙවියන් වහන්සේ) ඔවුන්ගේ ආත්ම මරණයෙන් නොගැළවිය." සාගතයෙන් ඔවුන්ගේ ජිවිත අවසන් විමට සැලැස්විය. එහිම සඳහන් කරයි. (ගිතාවලි 78-50) මෙයින් පෙන්නුම් කරනුයේ ආත්මය හා ජිවිතය එකක් බවය.

එසකියෙල් මගින් දෙවියන් වහන්සේ දෙවරක් ප්‍රකාශ කරන්නේ "පවුකරන අත්මය නසී" (එසකියෙල් 18:3-20) සැම්සන් ඔහුගේ අන්තිම යාච්ඤාවෙන් දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්නේ "මට පලස්තිනුවන් සමඟ මිය යාමට දෙන්න." කියාය. (විනිශ්චකාරයා 16:30) සමානත්‍වයෙන් සැම්සන් අදහස් කළේ "මගේ ආත්මය නසින්ට හළ මැනව" කියාය. එසේ නම් ආත්මය වනාහි පුද්ගලයා ජිවමාන ප්‍රාණියාය. ඔහු විනාශවන විට ආත්මය එසේත්

නැත්නම් ජීවිතය ඔහු සමගම විනාශ වේ.

## දෙවියන් වහන්සේගේ ස්වරූපයෙන් මිනිසා

මෙයින් අදහස් කරන්නේ මිනිසුන් හා සතුන් අතර වෙනසක් නොමැති බවද? එය එසේ නොවේ. උත්පත්ති 1-26 අපට කියන්නේ මිනිසා දෙවියන් වහන්සේගේ ස්වරූපයෙන් මැවූ බවයි. ශාරීරික ස්වභාවය අතින් මිනිස් වර්ගයා හා සතුන් සමානය. නමුත් මිනිසාට ශ්‍රේෂ්ඨ මනසක් ඇත. තේරුම් ගැනීමට හා දෙවියන් වහන්සේට පිළිතුරු දීමට හැකියාව ඇත. (ගීතාවලි 49-20) එහෙයින් මිනිසා සහ සතුන් අතර වෙනස අවබෝධ කළ හැකිය. අවබෝධකරන්නේ කුමක්ද කියා අප අසන විට නව ගිවිසුම් බලසම්පන්නව අපට පිළිතුරු දීමට පැමිණෙන සැටි බලමු.

බයිබලයේ සාක්ෂි බොහෝ දුරට බලන විට මළවුන් විවේක ගනී යනුවෙන් ඉගැන්වීම් පුදුමයක් නොවේ. සොහොන තුළ විසඳෑව සිටී. කවරෙකු හෝ මිනිසෙකු කෙරෙහි විශ්වාස නොකරන්න යයි. ගීතාවලිය කියන්නේ "ඔහුගේ හුස්ම පිටවන විට ඔහු පොළොවට හැරී එන්නේය." එදාම ඔහුගේ සිත විනාශ වන්නේය." (ගී.146:5) දෙවියන්වහන්සේ හට ඩේවිඩ් බේරාගන්නැයි යාඥා කරයි. "මක්නිසාද මරණයේදී ඔබ සිහිකිරීමක් නැත. ෂෙයෝලේදී ඔබට ස්තුති කරන්නේ කවරෙක්ද?" (ගීතාවලිය 6:5) ගීතාවලි 115 කියන්නේද එයමය. "මළාහු ස්වාමීන් වහන්සේට ප්‍රසංශා නොකරති. නැතහොත් ඔවුනු නිහඬ වන්නාහ." (පදය 17) ඉක්ලිසියස් කතුවරයා උසස් ලෙස කියන්නේ ද එයයි. ජීවත් වන්නෝ මැරෙන බව දනිති. මළාහු කිසිවක් නොදනිති........ ඔවුන්ගේ ආදරය තරහව වෛරය විනාශ විය. යමක් ඔබට කිරීමට ඇත්තේද එය බලවත්ව කරන්න. සේවය කිරීමක් හෝ නුවණක් දැනීමක් බුද්ධියක් ඔබ යන්නාවූ සොහොනේ නැත. (9-5-10) මළවුන්ගේ ස්ථානය "මාගේ පොළොවේ" (මිනිසා මහ පොළොවේ දූවිල්ලෙන් සාදනු ලැබිනි. ) "සොහොන් තුළ, "නිහඬතාවයේ" වශයෙන් ඉතා පැහැදිලිව මෙම ජේදයෙන් විස්තර වේ.

## මරණයේ නින්ද

දානියෙල් හි මේ පිළිබඳව සිහිකටයුතු විශේෂ වාර්තාවක් ඇත්තේය. එය නව ගිවිසුමෙහි සමාන අදහස ලෙස යොදා ඇත. "අන්තිම දින වල දී, දෙවියන් වහන්සේ නැවත වරක් ඔහුගේ බලය මහපොළොව මත පෙන්වා "පෙරනොවූ විරූ කරදර කාලයක්" යනුවෙන් මෙම අනාගත වකවයේ සම්බන්ධය පෙන්වයි.

මහපොළොවේ දූවිල්ලෙහි සැතපෙන බොහෝ දෙනෙකු අවදි කරනු ලබන්නාහ. සමහරකුට සදාකාල ලැජ්ජාව පිළිකුල දෙනු ලබන්නේය. (දානියෙල් 12:1-2)

මේ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ දෙවියන් වහන්සේ තමන්ගේ විශ්වාසී සේවකයන් හට පැහැදිලි ආරක්ෂාව හා ඔවුන්ට සදාකාල ජීවනය ලබාදෙන බවයි. නමුත් ඔවුන් මේ ත්‍යාග ලබන තෙක් සිටින්නේ කොහේද?

"ඔවුහු පොළොවේ දූවිල්ලේ නිදති" මේ සාක්ෂිය අනුව අප විසින් බොහෝ දුරට සිතා බැලිය යුතුය.

මේ කාරණයෙහි ලා සමහර කියවන්නෙකු මෙසේ කියනු ඇත. "බොහෝ දුර" ඔබ පරණ ගිවිසුම විස්තර කරන්නේ ඇත්තෙන්ම යේසුස් වහන්සේගේ අළුත් හෙළිදරව්ව හා සුභාරංචිය නොවන්නේද, එය තරමක් වෙනස් කියමනක් නොවන්නේද කියාය.

## යේසුස් වහන්සේ අපෝස්තුළුවරුන් හා පැරණි ගිවිසුම

මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට යේසුස් වහන්සේගේ ස්වභාවය පිළිබඳ මනා අවබෝධයක් හා උන්වහන්සේට පසුව සිටි අපෝස්තුළුවරු ගැන පැරණි ගිවිසුම යනුවෙන් දන්වා ලියවිලි ද වටහා ගත යුතුය. සත්‍ය පැහැදිලිය. ප්‍රශ්නයකින් තොරව සත්‍ය පැහැදිලිය. ඔවුහු සියල්ලෝම ව්‍යවස්ථාව, ගිතිකා හා අනාගත වක්තෘෘන් දෙවියන් වහන්සේ විසින් මෙහෙයවන ලද බවත් වචනය දෙවියන් වහන්සේගේ බවත් පිළිගත්හ. ඔවුහු තම දේශනය සඳහා ඒවා විස්තර කිරීම උපකාර කරගත්හ. ඔවුහු පැරණි ගිවිසුමේ කිසිදු කොටසක් ඉවත දැමුවේ හෝ වෙනස් කළේ නැත. උදාහරණ ස්වල්පයක් මෙන්න,
ගලිලයේ විනාශයක් සිදු වී තිබිණ. ආගමික කැරැල්ලකදී රෝමානු සොල්දාදුවන් යුදෙව්වන් කිහිපදෙනෙකු ඝාතනය කරන ලදි. යුදෙව්වන්ගේ සමහරෙක් මේ පිළිබඳව යේසුස් හට පැවසීමට පැමිණියහ. ඔහුගේ ප්‍රතිචාරය ඉතා වැදගත්ය. මෙවන් ඉරණමකට මුහුණ දුන් නිසා ඒ යුදෙව්වන් නුඹලාට වඩා පවුකාරයන් යැයි නුඹලා සිතනවා දැයි ඔහු ඇසීය. එය එසේ නොවේ, නමුත් මම මෙසේ පවසමි.

"නුඹලා පසු තැවෙන්නේ නැතිනම් නුඹලා සියල්ලන්ම එසේම විනාශ වන්නාහුය." (ලූක් 13:1-3) "විනාශයට" යන බයිබල් යෙදුම අදහස් කරන්නේ අප අදහස් කරන දේමය: ජීවයක් නොමැතිව පැවැත්ම පැවත්වීමයි. යේසුස් වහන්සේගේ උගැන්වීම් තුළින් කියැවෙන්නේ මෙයයි. සියළු මිනිස් වර්ගයා පසු තැවෙන්නේ නැතිනම් විනාශයෙන් ගැලවිය නොහැක. මෙය ගීතාවලි 49 ට

සමානය. මිනිසා සතුන් මෙන්ම විනාශ වන්නෝය - ඔහු තේරුම් ගන්නේ නැත්නම්, අපගේ ප්‍රශ්නයට පළමු ඉඟිය මෙය වේ. "අවබෝධය කුමක්ද?" පසු නැවීම පිළිබඳ සාක්ෂිය මෙය වේ.

පොළොවේ දූවිලි තුළ නිදන බොහෝ දෙනා නැගිටුවනු ලබන්නේය. (12-12) යන දානියෙල්ගේ අදහසට යේසුස් වහන්සේ එකඟ වේ. මෙය යොහාන් ගේ සුභාරංචිය පිළිබඳ වාර්තාවෙහි කියවෙන ආකාරයයි. "සොහොන් වල සිටින සියල්ලන්ම උන්වහන්සේගේ වචන අසන වෙලාව පැමිණෙන්නේය. එයින් එළියට පැමිණ යහපත කළාහු සදාකාල ජීවනය සඳහා නැගිටවනු ලබන්නේය. අයහපත කළාහු විනාශයට යවනු ලබන්නාහු." (යොහාන් 5:28-29) (යේසුස් වහන්සේගේ "සියල්ලන්" යන යෙදුම වෙනුවට දානියෙල් "බොහෝ" යන්න යොදා ඇත. ඒ ඔවුන්ගේ ජීවිත කාලය තුළ "දේව පුත්‍රයාගේ වචනය" ඇසුවන්ය. (පදය 25)

මියගියවුන් කොහේද? "සොහොන් තුළ" (මහපොළොවේ දූවිල්ලෙහි නිදන - දානියෙල්) ඔවුහු පිටතට පැමිණ ජීවිතයට හෝ විනිශ්චයට පත් වෙති. යේසුස් වහන්සේගේ හා දානියෙල් අතර එකඟතාවය මෙයයි. ස්වාමීන් වහන්සේ පැරණි ගිවිසුමේ වැදගත් කරුණු හා මිය ගියවුන්ගේ ඉරණම ගැන එකඟවේ. අපෝස්තුළුවරු මෙම ඉගැන්වීම් පවත්වාගෙන ගියහ. නව ගිවිසුමේ හොඳින් දන්නා පදයක යොහාන් විස්තර කරන්නේ, "මක්නිසාද දෙවියන් වහන්සේගේ ස්වකීය ඒකායන පුත්‍රයාණන් දෙන තරම් ලෝකයට පෙම්කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්නා සැම දෙනාම විනාශ නොවී සදාකාල ජීවිතය ලබන පිණිසය." (3-16).

එපීසයෙහි විශ්වාසිකයින්ට අපෝස්තුළු පාවුල්තුමා නාමලේඛණ වලින් මේ සමාන කරුණක් කියයි. ඔවුහු යේසුස් වහන්සේ පිළිබඳව විශ්වාස කිරීමට පෙර ඔවුහු ක්‍රිස්තුස් වහන්සේට අයත් නොවූ බවත්..... බලාපොරොත්තු රහිත වූ බවත් ලොව දෙවිකෙනෙක් නැතුව සිටි බවත්ය. "(එපීස 2-12) මෙය බිඳ දමන සුළු කියමනක්ය. එය අපට පැහැදිලිව කියන්නේ අප ක්‍රිස්තුස් වහන්සේ මගින් දෙවියන් වහන්සේට සම්බන්ධ නොවේ නම් ඔහුගේ මාර්ගය නොලබා අප "බලාපොරොත්තු රහිත වන බවයි." මේ "අවබෝධය" කෙතරම් මා හැඟිඳ යත් අප එබඳු දරුණු ඉරනමකින් ගැලවේ. අනාගතයේ ඔවුන් කරන්නේ කුමක්දැයි පිළිබඳව ඉතා තදින් පෞද්ගලිකව කටයුතු නොකරන ලෙස අපොස්තුළු ජේම්ස්තුමා තම අනුගාමිකයන්ට කියයි. "හෙට වන්නේ කුමක්ද කියා නුඹලා නොදන්නාහුය. ඔහු මෙසේද කියයි. "නුඹලාගේ ජීවිත කුමක්ද සුළුවේලාවකට පෙනෙන හුමාලයක් වැනිය. එය පසුව නැතිව යන්නේය." "(ජේම්ස් 4:14 ප්‍රතිසංස්කෘත) රිවයිස් ස්ටෑන්ඩර්ඩ් වර්ෂන් හා නිව් ඉංග්ලිශ් වර්ෂන් හි සඳහන් වන්නේ, ඔබ දුමක් මෙන් පෙනී නැවත

නැතිවන්නේය." යනුවෙනි.

අපෝස්තලුවර පාවුල් තුමා විසින් දානියෙල් විස්තරයේ එන සොහොන් තුළ "නිදන" යන්න නැවත ඉදිරිපත් කරයි. ක්‍රිස්තුස් වහන්සේ පිළබඳ විශ්වාස කළ අයෙකු මළ විට තෙසලෝනිකයෙහි අනුගාමිකයින් වැලපුනි. තවද, "සහෝදරයෙනි, බලාපොරොත්තුවක් නැත්තාවූ අන් නැතැත්තත් මෙන් නුඹලා සෝක නොවන පිණිස සැතපෙන්නන් ගැන නුඹලා නොදැන සිටිනවාට අපි නොකැමත්තෙමුව. මක්නිසාද යේසුස් වහන්සේ මැරී නැවත නැගුටුසේකැයි අපි අදහමු නම්, එසේම දෙවියන් වහන්සේ යේසුස් වහන්සේ කරණකොටගෙන සැතපී සිටින්නන් උන්වහන්සේ සමඟ ගෙනෙන සේක. මක් නිසාද ස්වාමීන් වහන්සේගේ ඒම දක්වා ජීවත්ව ඉතුරු වෙන අපි සැතපුණු තැනැත්තාට කිසිසේත් ඉස්සර නොවන්නෙමුයැයි ස්වාමීන්වහනසේගේ වචනයෙන් අපි නුඹලාට කියමුව. මක් නිසාද ස්වාමීන්වහනසේ මහත් ශබ්දයක් උත්තම දේවදූතයෙකුගේ හඩද දෙවියන්වහනසේගේ හොරණෑ නාදයද ඇතුළුව ස්වර්ගයෙන් බස්නා සේක. ක්‍රිස්තුස් වහන්සේ තුළ මළාවූ අය පළමු කොට නැගිටින්නෝය. (4-13-16) මේ ජේදය කියන්නේ කුමක්ද යන්න තෙරුම් ගත යුතුය. භක්ති වන්ත විශ්වාසයෙන් මිය ගියාහු "නිදන්නෝ" ද විශ්වාස නොකරන්නේ මිය ගියාහු "බලාපොරොත්තුවක් නැති" යනුවෙන් හැඳින්වේ. ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේම ස්වර්ගයෙන් බැස විශ්වාසීව මිය ගියවුන් ඇත්තෙන්ම සොහොනෙන් නැගිට වන්නාහ. නව ගිවිසුම පුරා ඇති ඉගැන්වීම් මේවාය. ඒවා සුභාරංචියේ පදනම්ය.

## මළවුන් නැඟිටීම

මරණින් පසු නොකඩවා පවතින ආත්මයක් ඇතැයි විශ්වාසය කරන්නවුන් අමරණිය ජිවිතයක් හෝ ආත්මයක් පිළිබඳ විශ්වාසය තදින් පවත්වති. නව ගිවිසුම සැම විටම මළවුන් නැගිටීම පිළිබඳ අදහසේ සිටිති.

නව ගිවිසුමේ ප්‍රකාශය ගැන ප්‍රශ්නයක් නැත. යේසුස් වහන්සේ එය සතසසේ භාරගනි. යුදෙව්වෝ තමාගේ ධනවත් අසල්වැසියාට තමාගේ උත්සව වලට ආරාධනා කරනුයේ ආපසු ඔවුන්ට ද ආරධානා ලැබීමේ අදහසිනි. නමුත් දුගියන්ට ආරාධනය කරන්නේ නම් ඔවුන් ඔබලා හට යුක්ති සහගත නැවත නැගිටීමේදි ප්‍රතිඵල ලබා දෙනු ඇත. (ලූක් 14:14) භක්ති වන්ත විශ්වාසකයින් තමන්ගේ සොහොන් වලින් නැගිටුවනු ලැබූ විට ඔවුනු තමන්ගේ තෑගය ලබනු ඇත.

අපෝස්තුලු පාවුල්තුමා සම්පූර්ණ පරිච්ඡේදය වැය කරන්නේ මළවුන් නැගිටීම පිළිබඳ විස්තර කිරීමටය. ඔහු විශේෂිත කරුණු රැසක් මත

විවාදශීලිව යේසුස් වහන්සේ මළවුන්ගෙන් නොනැගිට්යා නම් වෙනත් කිසිවෙකුට එසේ නොහැකිවනු ඇතැයි පවසයි. ක්‍රිස්තුස් වහන්සේ තුළ නිදාගත් ඔවුහුද විනාශවනු ලබත් (1 කොරින්ති 15:18) (මෙම ප්‍රකාශයේ යෝජනාව මෙයයි) ඉදින් යේසුස් වහන්සේගේ විශ්වාසිකයින් විනාශවේ නම් අවිශ්වාසීන් කොතරම් වැනසේද?

නමුත් ඒ ගැන කිසිඳු සැකයක් නැත. පාවුල්තුමා කියන්නේ ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැගී සිටි බවයි. (ඔහුගේ සාක්ෂිකාරයන් පිළිබඳ ලැයිස්තුවක් මේ පරිච්ඡේදයේ 3-8 දක්වා පද වලින් බලන්න) ක්‍රිස්තුස් වහන්සේ එහෙයින් "නිදිගත්වුන්" අතරින් ප්‍රථම ඵලය විය. (පද 21) පද 3 කදී දෙවරක් පාවුල්තුමා මළවුන් ගැන විස්තර කරන්නේ "නිදිගත්වුන්" යනුවෙනි. දානියෙල් සමඟ ඔහුගේ අදහස එකඟ වේ.

මේ පරිච්ඡේදය ඉතිරි කොටසින් පාවුල් විස්තර කරන්නේ විශ්වාසයෙන් මළවුන් නැගිටවන ලැබූ පසු ඔවුන්ගේ ස්වභාවය වෙනස් වන බවයි. මාංශය ට හා රුධිරයට දෙවියන්ගේ රාජ්‍ය ලබා ගත නොහැක. වර්තමාන අපේ තත්වය නැසෙන සුළු හා නාස්ති වන ස්වභාවයයි. නමුත් මළවුන් නැගී සිටි පසු ඔවුන් "වෙනස්" විය යුතුය. මේ දිරන ස්වභාවය නොදිරන ස්වභාවයට පත්වේ. මේ නසින ස්භාවය නොනසින ස්භාවයට පත්වේ. "මරණය වැනසීමට ඇති ජයග්‍රාහී ක්‍රමය මෙයයි." (පද 50-54)

ඉතින් අප බයිබලයේ පැහැදිලි සත්‍යය වන විශ්වාසිකයන්ගේ ත්‍යාගය වන විනාශ නොවන, නාස්ති නොවන සිරුරක් ලබනු ඇත. එය ආත්මිය ජිවත් විමක් නොවනු ඇත. කාරණය වැදගත්ය. දෙවියන් වහන්සේට විශ්වාසිකයින් පිළිබඳව අනාගත වැඩ කොටසක් ඇත. යමෙක් සොහොන් වලින් නැගිටවුනු ලැබුවාහු නියම ලෙස මෙලොව හැසිරේ. ස්පර්ශ කළහැකි මිනිසුන් සේ ලෝකයා දැනුවත් කිරීම සඳහා දෙවියන් වහන්සේ පිළිබඳව, අන්‍ය ජාතීන් නොදන්නා හෝ සියවස් ගණනක් නොසලකා හල සත්‍ය පැහැදිලි කරනු ඇත. බයිබලය පවසන ලෙස මෙය ක්‍රිස්තුන් වහන්සේ නැවත පැමිණෙන විට උන්වහන්සේගේ පාලනයේ බලාපොරොත්තු මෙය වේ.

## නමුත් ?

නව ගිවිසුමේ මරණින් පසු නැවත පැවතීම පිළිබඳ සඳහන් ජේද කිහිපයක් නොවන්නේද? කොටස් කිපයකදි ඉතා අඩු වශයෙන් මේ ඇසුරෙන් විස්තර කර ඇත. නමුත් ඒවා ඉතා පරීක්ෂාකාරීව හැදෑරීමේ දි ප්‍රධාන වශයෙන් ඒවා බයිබල් ඉගැන්වීම් සමඟ සැසඳේ. අපි එයින් හොඳින් දන්නා කොටස් කිපයක් ඉදිරිපත් කරමු.

## නිරය

පැරණි ගිවිසුමේ ෂියෝල් යන හිබෲ වචනයේ තේරුම වැසුනු, වට වූ ස්ථානයක් යන්නයි. සිංහල බයිබලයේ ෂියෝල් යන වචනය මිනී වළ හා පාතාලය යනුවෙන් පරිවර්තනය කර ඇත. උත්. 37:35 ගණන් කථාව 16:30,33 ගීතාවලි 16:10, "මම මගේ පුතා ළඟට සොහොනට යමි වැලපෙමින්........ (උත්පත්ති 37-35) සොහොන තුළ ඔබට කවුරු ස්තුති වන්න වේද? (ගීතාවලි 6:5) ඔබ යන "සොහොන" එහි වැඩ කිරීමක් ............ අවබෝධයක් නුවණක් නැත. (ඉක්ලීයියස්ටස් 9-10) "ඔවුන් පණපිටින් ගියොත්"..... (ගනන් කථාව 16:30)...... සියල්ලෝද පණපිටින් පාතාලයට කිඳා ගියෝය. ( 16:33) මක්නිසාද ඔබ මාගේ ආත්මය තිබෙන්නට හරින්නේය. (ගිතිවලිය 16:10)

ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ අනාගත වක්‍යයන් මෙසේය. "නුඹ (දෙවියන් වහන්සේ ) මගේ ආත්මය නිරයෙහි නොහල සේක.........." එහි අදහස වන්නේ දෙවියන් වහන්සේ ඔහුගේ ජීවිතය නොහොත් ඔහු සොහොනෙහි නොතබන සේක. එහි ඉතිරි කොටසින් පෙන්වන්නේ "නුඹ වහන්සේගේ ශුද්ධ තැනත් වහන්සේ කුණු වෙන්ට නාරින සේක." (ගීතාවලි 16-10)

අපෝ පේදුරුතුමා නව ගිවිසුමේ (ක්‍රියා 2-31) හි සිරිත් පරිදි ග්‍රීක් වචනය "නිරය" යනුවෙන් යොදා ඇත. ගීතාවලියේද එම ක්‍රමයෙන් මේ වචනය යොදා ඇති බව අවබෝධ කර ඇත.

## ගිහෙන්නා

කෙසේ නමුත් නව ගිවිසුමේ වචනයක් "නිරය" වශයෙන් පරිවර්තනය කර ඇත. එය ඉංග්‍රිසියෙහි ගිහෙන්නා යනුවෙන් යොදා ඇත. මෙය ජෙරුසෙලමේ නගරයේ පිටත ස්ථානයක නමකි. ග්‍රීම් කේයර් ග්‍රීක් ඉංග්‍රීසි නව ගිවිසුම් ශබ්දකෝෂයෙහි පහත විස්තරය ඉතා ප්‍රයෝජනවත්ය. "ගිහෙන්නා" වැලපීමේ නිම්නය......... ජෙරුසෙලම් නගරයට ගිනිකොන දෙස වූ ළමුන්ගේ හැඩීමේ නිම්නය යයි නම් ලද, මොලොක්, නම් ගවයෙකුගේ හැඩයෙන් යුත් ප්‍රතිමාවට කුඩා ළමුන් විසිකරන ලදි. ජෝශියා රජු විසින් මෙම භයානක පූජාව තහනම් කළ පසු යුදෙව්වරු මෙම ස්ථානය ඉතා පිළිකුල් කළහ. (2 රාජාවලි 23-10) එයින් පසු සියළු කුණු කසල පමණක් නොව සතුන්ගේ මළකුණුද නොවලලන ලද අපරාධ කාරයින්ගේ සිරුරු ද මෙහි දමන ලදි. වලෙහි ගඳ මුසු සුළං ඇතුල්වීමද අප්‍රිය කළ නිසා නිතර ගින්නෙන් දැවෙමින් තිබිණ. මේ සිදුවීම් වලින් පසුව "එය ගින්නෙහි ගිහෙන්නා" යයි කියන ලදි.

"ගිහෙන්නා" යන නම නව ගිවිසුමේ 12 වරක් යොදා ගෙන ඇත. 11 වරක්ම යේසුස් වහන්සේ විසින් යොදාගෙන ඇත. ඉන් එක් සිද්ධියක් මෙසේය. "නුඹේ ඇස නුඹට කරදර කෙරේ නම් එය උදුරා දමන්න" (නුඹ වරදට පොළඹනවා නම් (ප්‍රතිසංස්කෘත පිටපත) එය උදුරා දමා පන්න. නුඹට එක් ඇසකින් දිව්‍ය රාජ්‍යයට ඇතුල්වීම යෙහෙකි. දෑසින්ම යුතුව නිරයට හෙලීමට වඩා එය නුඹට යහපතකි. (ගිහෙන්නා) එහි උණුසුම අඩු නොවේ නම් ගින්න තෑප්තිමත් නොවේ. (සම්පූර්ණ ජේදය බලන්න. (මාක් 9:43-48)

යේසුස් වහන්සේ අදහස් කළේ ඔබ ඔබේ අතින් යමක් කරන්නේද ඔබේ පා වලින් කොහේ හෝ යන්නේද ඇස් වලින් යමක් දකින්නේද එය ඔබ දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීම වලකාලන්නේ නම් එය නවත්වන්න නැතිනම් නුඹ නපුරක් සමඟ මරණයෙන් සියල්ල අවසන් වනු ඇත. පනුවා සහ ගින්න විනාශයේ සංකේත වේ. නමුත් සදාකල් ජිවත් නොවුනත් සියල්ල විනාශයට පත්වනතුරු ඔවුන්ගේ ක්‍රියාව පවත්වාගෙන යති. එහෙයින් "ගිහෙන්නා" අවසන් දිනයේදි විනිශ්චයට පැමිණිමක් බඳුය. අනිකුත් සියළු ස්ථාන වල "ගිහෙන්නා" යන්න යොදා ඇත්තේ සමාන අදහසිනි.

## ආත්මය

පැරණි ගිවිසුමෙහි කොටස් බොහෝවිට "ආත්මය, යනුවෙන් පෙන්වා ඇත්තේ "පුද්ගලයා" හා ඔහුගේ "ජිවිතයයි" ඔහුට පව් කළ හැක. මරණයට පත්වේ.

මෙසේ පරිවර්තනය කල වචනය නව ගිවිසුමෙහි 100 වරක් පමණ පාවිච්චි කර ඇත. එහි "ආත්මය" "ජිවිතය" "සිත". යේසුස් වහන්සේගේ කීම් වලින් සැලකිය යුතු එකක් ලෙස උන් වහන්සේ තම ගෝලයින්ට කියා අවසානයේ යමෙක් උන් වහන්සේගේ සබෑ ගෝලයෙකු වීමට කැමැති නම් තමා ප්‍රතික්ෂේප කර ඔහුගේ කුරුසිය ගෙන මා අනුව එන්න යනුවෙනි. උන් වහන්සේ තවත් කියන සේක්: "මක්නිසාද, යමෙක් තමාගේ ජිවිතය ගලවා ගන්නට කැමති වේද එය ඔහුට නැතිවන්නේය. මා නිසා තමාගේ ජිවිතය නැතිවන අයට එය සම්බ වන්නේය. යම් මනුෂ්‍යයෙකු මුලු ලෝකය ලබාගත්තත් තමාගේ ජිවිතය නැති වුනොත් ඔහුට මොන ලාභයක්ද? නොහොත් මනුෂ්‍යයෙක් තමාගේ ජිවිතය වෙනුවට දෙන්නේ කුමක් ද ? (මැතිව් 16:25-26)

සිංහල කියවන්නෙකු සිතන්නේ මෙහිදි වෙනස් වචන දෙකක් යොදා ඇති බවයි "ජිවිතය" සහ "ආත්මය" නමුත් එය සම්පූර්ණ අදහස ඇති මුල් ග්‍රීක් වචනය ලෙස පරිවර්තනය කර ඇත්තේ "ජිවිතය" සියළු අවස්ථා සඳහාය.

තවත් නිතර විස්තර වන කොටසක් වන්නේ "සිරුර නසන්නන්ට නමුත් ආත්මය නසන්නට නුපුලුවන් වූ අය වලුන්ට භය නොවෙල්ලා. මෙය හැඟවන්නේ ඉතා වැදගත් දෙයක්ය. නමුත් පදයේ දෙවන කොටස කියන්නේ ඔහුට බිය වන්න (දෙවියන් වහන්සේට) උන් වහන්සේට සිරුර හා ආත්මය නිරයේ හෙලිය හැක. ("ගිහෙන්නා" මතෙව් 10:28)

එහෙයින් ආත්මය නැසිය හැක. යේසුස් වහන්සේගේ අදහස අවබෝධයට අපහසු නොවේ. ඉදින් භක්තිවන්ත සේවකයෙකු මරණයට පත්කරනු ලබන්නේද, ඔහුට ජිවිතය (හෝ ආත්මය) අප දන්නා අයුරින් මළවුන්ගේ නැගිටීමේදී ලැබෙන්නේය. නමුත් අවිශ්වාසිකයින් සහමුලින්ම මරණයේ වැනසේ. ගිහෙන්නා මගින් විනිශ්චය නිදසුන් වේ. ඔහුගේ "ජිවිතය" හෝ "ආත්මය" ඔහු සමහ නැසේ.

## පොහොසත් මිනිසා හා ලාසරස්

කියවන්නා මේ ජේදයට හුරුපුරුදු නැත්තෙක් නම් (ලූක් 16:19-31) ඔහුට එම කොටස අවධානයෙන් කියවීමට නිර්දේශ කරනු ලැබේ.

ලාසරස් නම් යාචකයා මිය ගිය පසු දේවදූතයෙක් ඔහු ආබ්‍රහම්ගේ ඇකයට ගෙන යති. පොහොසතා ද මිය යයි. නමුත් ඔහු නිරයේ දුක් විඳිමින් ඉන්නා අතර "ඈත" ආබ්‍රහම්ගේ ඇකයේ සිටින ලාසරස් දකී. ඔහු ආබ්‍රහම්ගෙන් ලාසරස් ලවා "ඔහුගේ ඇඟිල්ල දියෙහි තෙමා තමාගේ දිව සිසිල් කරන ලෙස එවනමෙන් ඉල්ලයි. ඉල්ලීම ප්‍රතික්ෂේප වේ. පෙර පෝසතා ඔහුගේ විපාකය විඳගත යුතුය. අනිත් අතින් ඒබ්‍රහම් කියනුයේ අප අතර මහත් පරතරයක් ඇත. එහෙයින් එක් තැනකින් අනෙක් තැනට යාමට නොහැක. පොහොසතා ඔහුගේ සහෝදරයන් පස්දෙනා ළඟට ලාසරස්ව යවා අවවාද කිරීමට ඉල්ලා සිටියි. නැතහොත් ඔවුහුද මැරී තමන් මෙන් මහත් දුකට පත්වන නිසාය. මේ ඉල්ලීමද ඉවත දමන ලදි. මේ අනුව අප තව දුරටත් මොහොතක් කල්පනා කළ යුතුය.

මෙම කථාව වචනාර්ථයෙන්ම පිළිගැනීමට නොහැකි කාරණා කිහිපයක් ඇත" මරණින් පසු ධර්මිෂ්ඨකයන්ගේ ස්ථානය ආබ්‍රහම්ගේ ඇකය ලෙස: දිව්‍ය සුව විඳින ආබ්‍රහම් හා "නිරයේ" සිටින පොහොසතා අතර සංවාදය, "දිව සිසිල් කිරීම සඳහා එක් තැනක සිට වෙන් තැනකට රැගෙන යාම. සත්‍ය වශයෙන් මෙය මිය ගියවුන් අතර වූ සත්‍ය සිද්ධියක් නොවේ. එක්තරා විදියක උපමාවකි. නිදර්ශනයකි. මෙ කරුණ එකල සිටි පරිසිවරයන් අතර පැවැති එකකි. පළමු සියවසේ "ජෝසිෆස්" නම් ඉතිහාසකරු ඔහුගේ "හෙදිස්" පිළිබඳ සාකච්ජා කළ කරුණුවලින් මෙය පෙන්වයි. යේසුස් වහන්සේ

උන් වහන්සේගේ විරුද්ධ කාරයින්ගේ අදහස් ඔවුන් නොමඟ යවන්නට යොදාගත් බැව් පෙනේ. නමුත් ඒ ජේදයේ අවසානයේ යේසුස් වහන්සේගේ නියම අරමුණ පෙන්වයි. පොහොසතා ඒබ්‍රහම්ගෙන් ලාසරස් එවා ඔහුගේ සොහොයුරන්ට අවවාද කරන ලෙස ඉල්ලයි. ඒබ්‍රහම් පිළිතුරු දෙමින් ඔවුනට මොසෙස් හා දිවැසිවරු සිටිති. ඔවුන්ට ඒ අයට ඇහුන්කං දියහැක." ඉදින් කෙනෙක් මළවුන් වෙතින් ඔවුන් කරා ගියහොත් ඔවුහු පසුතැවෙනු නොවනු ඇතැයි ඒබ්‍රහම් පිළිතුරු දෙයි. "ඉදින් ඔවුහු මොසෙස්ට හා දිවැසිවරුන්ට කන්දෙන්නනේ නැති නම් මළ වුන්ගෙන් කෙනෙක් නැගිටවුද? ඒ අදහස පිළිගනිද?.

ඉතා සුළු කලකින් මෙම කියමන සම්පූර්ණ විය. යේසුස් වහන්සේ මාර්තා හා මේරිගේ නියම සොහොයුරා වූ ලාසරස් මළවුන්ගෙන් නැගිට වූ සේක. මේ හාස්කම මිනිසුන් තුළ මහත් පෙරලියක් ඇති කළේය. ගැඹුරු ලෙස හඹා යන ලදුව යුදෙව් නායකින් ඔහු මැරීමට තීරණය කළහ. එයින් සුලු කලකට පසුව යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැගිටුවාහ. එය බලවත් සිදුවීමක සාක්ෂියක් විය. යේසුස්ගේ නැවත, නැගිටීමේ සාක්ෂි පිළිනොගත් යුදෙව් නායකයන්, එතුමාගේ නැවත නැගිටීමත් දේව පුත්‍ර භාවයත් ප්‍රතික්ෂේප කළහ. ඔවුහු තමන්ගේම ශුද්ධ ලියවිලි නොපිලිගත්හ.

මෙය සම්පූර්ණයෙන් පොහොසත් මිනිසා හා ලාසරස් අතර කථාවේ අරමුණ විය. පැහැදිලිවම එය යේසුස් වහන්සේට අවශ්‍ය වූ කාරණයට සම්පූර්ණ සම්බන්ධ විය. එහෙයින් අපහට මළවුන්ගේ ස්වභාවය පිළිබඳව ඉගැන්වීමක් නැත. සම්පූර්ණයෙන් ගත යුත්තේ බයිබලයේ ඉගැන්වීමය.

## කුරුසිය මත සොරා

ලූක් 23:39-43 දක්වා යේසුස් වහන්සේ කුරුසියේ එල්ලීම පිළිබඳව කරුණු සඳහන්ය. සොරු දෙදෙනෙකු ද ඔහු සමඟ ඇණ ගසනු ලැබිණ. ඉන් එක් අයෙකු කියනුයේ තමා යුක්ති සහගතව විනාශකළ බවයි. නමුත් මේ මිනිසා (යේසුස් වහන්සේ) කල වරදක් නැත. එහෙයින් යේසුස් දෙසට හැරෙමින් ඔහු කියනුයේ "ස්වාමිනි ඔබගේ රාජ්‍යයට පැමිණි විට මා සිහිකළ මැනව. (පදය 42) මෙය පුදුමය එලවන ඉල්ලීමකි. මෙයින් ඇඟවන්නේ කුමක්ද?

1 සොරාට යේසුස් වහන්සේ "ස්වාමීන්" විය.
2 සොරා යේසුස් වහන්සේ කුරුසිය ජයගනී යයි අදහස් කළේය.
3 අනාගත කාලයක යේසුස් වහන්සේ තමන් වහන්සේගේ රාජ්‍යයට පැමිණෙන්නේය.
4 ඒ වෙලාවට උන් වහන්සේ ඔහු සිහිකර ඔහුට ජීවනය දෙනු ඇත.

මේ සියළු පිළිගැනීම් නව ගිවිසුම් ඉගැන්වීම් හා එකඟ වේ. දැන් යේසුස් වහන්සේගේ පිළිතුර බලන්න.

"සත්‍ය/වශයෙන්/නුඹට/කියමි/අද/දින/නුඹ/මා/සමඟ/පාරාදීසයෙහි/සිටින්නෝය."

පැරණි ග්‍රීක් අකුරින් ලියන ලද මෙම පැරණිතම ලේඛණයේ සියළු අකරු ප්‍රධාන අකුරු වේ. වචන වෙන්කර නොමැත. විරාම ගැන එහි සැලකිල්ලක් දක්වා නැත. එහෙයින් ඔබ යේසුස් වහන්සේගේ පිළිතුර කෙසේ තෙරුම් ගන්නේද?

"සත්‍ය වශයෙන්" නුඹට කියමි "අද දින නුඹ මා සමඟ පාරාදීසයෙහිසිටින්නේය ?"

නොහොත් එය "ඇත්තෙන්ම" නුඹට අද කියමි "නුඹ මා සමඟ පාරාදීසයෙහි සිටින්නේය." එය යේසුස් වහන්සේගේ පොරොන්දුව වටහා ගැනීමට සියළු වෙනස්කම් පෙන්වා දෙයි. අප සිතන්නේ කෙසේද? ව්‍යාකරනුකූල බුද්ධිමත් ක්‍රමය විය හැකි (සෙමරොන් - ග්‍රීක) "අද දින" ප්‍රථම ක්‍රියාව හෝ දෙවනුව වශයෙන් ගත හැක. නමුත් එහි තවත් කල්පනාවට ගත යුතු දෑ ඇත.

1. යේසුස් වහන්සේ පැරණි ගිවිසුමේ එන සාමාන්‍ය හිබෲ ක්‍රමය මෙම ප්‍රකාශය සඳහා යොදාගෙන ඇත. නිදසුන් තුනක් ද්විතිය කථාවේ එන ජේදයක් නිදසුන් වශයෙනි. (ද්විතිය කථාව 4:26-39-40) නුඹට විරුද්ධව මෙදින මම අහසට පොළොවට සාක්ෂි වන ලෙස ඉල්ලමි........ එනිසා අද දින දත මැනව, එය ඔබේ හද තුළ කල්පනා කරන්න..... අද දින ඔබට දෙන අණ පනත් ඉටුකල යුතුය.

   යමක් පැහැදිලි කිරීමට "මෙදින" (හෝ අද දින) සම්පූර්ණ විශ්වාසයෙන් යුත් ශක්තිමත් වූ කිමකි. මේ සමාන සිදුවීම් 42 වරක් ද්විතිය කථාවේ පමණක් ඇත. එහෙයින් යේසුස් වහන්සේ හොඳින් දන්නා යුදෙව් ක්‍රමයෙන් තම අදහස ඉතා හොඳින් පැහැදිලි කර ඇත. "මම අද දින ඔබට කියමි......" යේසුස් වහන්සේගේ මෙම පොරොන්දුව සත්‍ය වශයෙන්ම සිදුවන්නක් බව සොරාට සහතික වශයෙන් තේරුම් ගත හැකි විය.

2 කෙසේ හෝ එදින යේසුස් වහන්සේ කොහේ විද? මහිමයෙන් යුතුව ස්වර්ගයේ නොවිය. ලියන්නන්ට හා පිරිසිවරුන්ට තමන් ගැනම

අනාගත වාක්‍ය කී ලෙස ඔහු සොහොන් ගෙයි විය. "මනුෂ්‍ය පුත්‍රයා දින තුනක් සහ රාත්‍රී තුනක් පොළොවේ හදවත තුළ සිටියි." (මතෙව් : 12-40) "හදවත" ඔහු අදහස් කලේ ඔහු සොහොනේ සිටින බවයි.

3 පරාදීසය යන්නෙන් අප තේරුම් ගන්නේ කුමක්ද? නැවත වරක් අප අපගේ අවබෝධය බයිබලය තුළින් ලබා ගැනීමට කල්පනාකාරී විය යුතුය. මිනිස් ආභාශයන් නොවේ. මේ වචනය මූලිකව පර්සි ජාතියන්ගේ වචනයකි.

පැරණි ගිවිසුමේදී මෙම වචනය "වනය" "උයන" "වත්ත" යනුවෙන් පරිවර්තනය කර ඇත. ස්වාමීන් වහන්සේ සඳහා කාලය පැමිණෙන විට සියොන් සනසවනු ලබයි යනුවෙන් ඉසෙයියස් විස්තර කරයි. ඔහු ඇගේ කාන්තාර ඒදන් උයන මෙන් කරනු ඇත.

"ඇගේ කාන්තාර ස්වාමීන් වහන්සේගේ උයන මෙන් සරසවනු ඇත." ( 51:3) පැරණි ගිවිසුමේ ග්‍රීක් පරිවර්තකයෝ (ක්‍රි.පූ 200) හිබෲ "උයන" යන වචනය පැරඩිසෝස් යනුවෙන් පරිවර්තනය කළහ. සොරාට පිළිතුරු දෙන යේසුස් වහන්සේ පාරාදීසය යන වචනය යෙදූහ. ක්‍රිස්තුස් වහන්සේට බොහෝ කලකට පෙර ඊශ්‍රායල් වරු තමනට පොරොන්දු වූ දේශය හිමිකර ගත්හ. ඉසෙයියස් දිවැසිවරයා එම දේශයේ සරුකම හා සොභාග්‍යය ගැන කියා ඇත. එහෙයින් පාරාදීසය යන්න අදහස් කරන්නේ යේසුස් වහන්සේ නැවත පැමිණීමේ දී පිහිටුවනු ලබන සාමය සතුට පිරුණ උන්වහන්සේගේ රාජ්‍යයයි. සොරා අදහස් කළේ "ඔහු ඔහුගේ රාජ්‍යයෙන් යුතුව එන්නේය" යනුවෙනි. මෙයින් අවබොධ වන්නේ මේ ජේදය ග්‍රීක් කථාන්දර වලට ණයගැති නොවන බවයි. නමුත් එය බයිබල් ඉගැන්වීම් වලට අදාලව ඇති බවයි.

ඉතා සුළු ප්‍රමාණයක් ජේදයන්හි මරණින් පසු නොකඩවා පවතින ආත්මයක් යන අදහසට ආධාරවන වචන යෙදී ඇතත් ඉතා පරීක්ෂාවෙන් විමසා බැලීමේදී ශුද්ධ ලියවිලි වල අනිත් ඉගැන්වීම් හා සැසඳෙන බව පෙනේ.

## වඩාත් ප්‍රචලිත වූයේ ඇයි?

ඇසීමට සුදුසු ප්‍රශ්නයකි. ඉදින් නොකඩවා පවතින "ආත්මයක් හෝ ජීවිතයක්" බයිබලය තුළ උගන්වන්නේ නැතිනම් ආගමික විශ්වාසයන් තුළ මෙතරම් තදින් මේ විශ්වාසය කෙසේ මුල් බැස ගත්තේද?

පැහැදිලි කිරීම සුළු දෙයකි. පුරාණ කාලයේදී මිත්‍යා ආගමික සියළු

ජාතින් තුළ මේ නොකඩවා පවතින ආත්මය පිළිබඳ අදහස සාමාන්‍ය දෙයක් විය. මිනිස් මනසේ  සාමන්‍ය බලාපොරොත්තුව මෙය නියෝජනය කරයි. මුල් ක්‍රිස්තියානියෙහි මේ අසත්‍ය විශ්වාසය බැහැර කරන ලදි. මුල් ක්‍රිස්තියානින් මිනිස් වර්ගයාගේ නැසෙන සුළු බව තේරුම් ගත්හ. ඔවුහු නව දිවියක් බලාපොරොත්තුවූයේ සුභාරංචිය මගින් පොරොන්දු වූ අයුරෙනි. මරණයේදී නොව ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීමේදී විශ්වාසිව මිය ගියවුන් ඔවුන්ගේ සොහොන් වලින් නැගිටවනු ඇත. කල්යාමේදී කෙසේ නමුත් රෝමානු ලෝකයේ මිත්‍යා ලබ්ධික ජාතින්ගේ හැරවීම බහුල විය. විය හැකි ලෙස බොහෝ මිත්‍යා අදහස් තමන් සමඟ පැමිණියහ. වැඩි දුරටත් ක්‍රිස්තියානි නායකයන් එහි ඉගැන්වීම් දාර්ශනිකයින් සමඟ එකඟ කිරීමට උත්සාහ කළහ. ග්‍රීකයන් විසින් දෙන ලද අමරණීයත්වයෙන් යුතු ආත්මය යන අදහස ඔවුන් අතර සාමන්‍ය අදහස විය.

නමුත් කෙසේ හෝ බයිබල් ඉගැන්වීම් ප්‍රකාශ කිරීමට මහත් උත්සාහයක් ගන්නා ලද අතර මුල් ක්‍රිස්තියානින් තුළ නැවත ක්‍රිස්තියානි විශ්වාසයන් මුල් බැස ගති. එබඳු ආපසු ඒමක් යුරෝපයේ සිදුවූයේ 16,17 සියවස්වලය. සත්‍ය විචෘතව හඳුනා ගත්තේ මෑත කාලයේ දේව ධර්මවාදි විචාරකයින් විසිනි. මේ විස්තර කිරීම් දෙස බලන්න. 1897 හි B.F. වෙස්කොට් කේම්බ්‍රිජ් දේවිමට් මහාචාර්යවරයා 2 තිමෝති 1-10 විස්තර කරමින් මෙසේ ලිව්ය. “අපේ ප්‍රධාන ආගමික විශ්වාසය නම් සදාකාල ආත්මයක් නොමැත. නමුත් නැවත නැගිටවන සිරුරක් ඇත. අපේ ගැලවුම්කරු ජිවනය සහ නොනැසිම (සදාකාල ජිවනය නොව) පැහැදිලි කළ සේක.........මේ සත්‍ය සිතේ දරමින් අපට පාවුල්තුමාගේ වචන වල බලය දැකිය හැක“ ස්වාමි වූ ක්‍රිස්තුස් වහන්සේ “අපේ පහත්කමේ ශරිර තමන් වහන්සේගේ තේජසේ ශරිරයට සමාන වන පිණිස වෙනස් කරනවා ඇත.” (පිලිප්පි 3-21 ප්‍රතිසංස්කෘත) ප්‍රතිසංස්කෘත නව ගිවිසුම් සමහර උගැන්වීම් ඒ සමානය...... පිටුව 192

1924 ලන්ඩන් හි බිෂොප් ගෝර් මෙසේ ලියයි. “මා සිතන්නේ....... මිනිස් ස්වභාවය පිළිබඳ ඉගැන්වීම් වල යෝජනාව වන්නේ මිනිසාගේ ආත්මය නොනැසිය හැකි හා සදාකාලික වීමට අවශ්‍ය ලෙසයි........ මෙය ග්‍රික් දර්ශනය තුළ මිස ශුද්ධ ලියවිලි තුළ නොවේ.” (“ශුද්ධාත්මය හා පල්ලිය” පිටුව 288 අඩෝලිපිය.)

යුද්ධ කාලයේ අභක්තිකයන් ඉදිරියේ එංගලන්ත සභාව කොමිසමක් පිහිටුවා එහි සභාපතිකම බිෂොප් රොචෙස්ටර්ට පැවරුහ. බොහෝ ආගමික සංවිධාන වල සාමාජිකයින් සහභාගි විය. වාර්තාව TOWARDS THE CONVERSION OF ENGLAND යනුවෙන් 1945 දි ප්‍රසිද්ධ  කරන ලදි. එහි මේ ජේදය සඳහන් වේ.

"මිනිසාගේ විනාශකළ නොහැකි ආත්මය (හෝ විඥාණය) යන අදහස ග්‍රීක් දර්ශනයට ණය ගැතිය. එය බයිබලයට අයත් නොවේ. නව ගිවිසුමේ තේමාව සදාකාල ජීවනය වේ. එය කාට හෝ සියල්ලන්ට නොවන මුත් යේසුස් වහන්සේ පිළිබඳ විශ්වාසයෙන් මළවුන්ගෙන් නැගිටවූවන්ටය."
(පිටුව 23)

ඇත්තෙන්ම මෙය සැලකිය යුතු ප්‍රකාශයකි. ශුද්ධ ලියවිලි තුළ අපට හමුවන සියළු ඉගැන්වීම් ස්ථිර කිරීමකි. මිනිසා සහ ස්ත්‍රිය ඉබේටම මරණය ජය නොගනි. ස්වභාව වශයෙන් ඔවුහු සොහොන් තුළ විනාශවෙති. යමෙකුට සදාකාල ජීවිතයට ඇතුල්වීමට එසේ කරනු ලබන්නේ යේසුස් වහන්සේගේ පැමිණීමේ දී සිදුකරන නැවත නැගිටුවීමේ ප්‍රතිඵලයක් ලෙසය.

## අත්‍යවශ්‍ය පණිවිඩය

මේ වැදගත් කරුණ පිළිබඳව බයිබලයේ ඉගැන්වීම් වලින් අප කළ ලුහුඩු පරීක්ෂණ මගින් එක් දෙයක් පැහැදිලි විය. එහි අඩංගු පණිවිඩය අප සියල්ලන්ටම අත්‍යවශ්‍ය වේ. මක් නිසාද, අප එය නොසලකන්නේ නම් අප විනාශ වනවා ඇත. ඒනිසාය. එහි පණිවිඩය "සුභාරංචිය" යනුවෙන් හඳුන්වන්නේ එම යහපත් ප්‍රවෘත්තියයි. එය කොතරම් අත්‍යවශ්‍ය දැයි පාවුල්තුමා කොරින්තිහි තමාගේ කියවන්නන්ට සිහි කිරීම මගින් පෙන්වූයේ

"මවිසින් නුඹලාට දේශනාකල සුභාරංචිය..... ඒ මගින් නුඹලාට ගැලවීම වේ. ඉදින් මා නුඹලාට දේශනා කළේ කුමක් දැයි සිහි තබා ගත්තේ නම්...." (1 කොරින්ති 15-1,2)

ඔහු රෝම වරුන්ට ලියන්නේ "මම යේසුස් වහන්සේගේ සුභාරංචිය මගින් ලැජ්ජා නොවෙමි. හේතුව එය විශ්වාස කරන සියල්ලන්ට ගැලවීම පිණිස දෙන ලද දෙවියන් වහන්සේගේ බලයයි. (රෝම 1:16)

මේ සුභාරංචිය විනාශවන අප වර්ගයාට මොනතරම් වටින්නේද? මේ පණිවිඩය තවමත් අප අතර බයිබලයේ පිටුමත යේසුස් වහන්සේගේ හා අපෝස්තලුවරුන්ගේ වචන තුළ පැවතීම මොනතරම් පුදුමයක් ද? අප මේ "ජීවිතය" යන වචනය අපේ අරමුණ කර ගනිමු. අපට තවමත් අවස්ථාව තිබේ. හේතුව අපේ අනාගතය අවදානම් නිසාය.

ෆ්‍රෙඩ් පියර්ස්

ඉංග්‍රීසි මුල් පිටපතෙන් පරිවර්ථනය කරන ලද මෙය
සියලු හිමිකම් හිමි

"THE CHRISTADELPHIAN MAGAZINE AND PUBLISHING
ASSOCIATION (BIRMINGHAM, UK),

හි කාරුණික අවසරය මත මුද්‍රණය කරන
ලදී.

## ප්‍රශ්න

1. බයිබලයේ ලේඛකයන් ඔවුන් "යෙදවූ" බවට ප්‍රකාශ කරයි. මෙහි තේරුම කුමක් ද? ඔවුන් යෙදවූයේ කවරෙක්ද?

2. සමහර බයිබල් පරිවර්තන, "ජීවත්වන ආත්ම" ගැන කථාකරයි. "ජීවත්වන ආත්මයන්" කුමක්ද?

3. ඔවුන් මිය යන බවත් නැවත දූවිල්ලට හැරෙන බවත් දෙවියන් වහන්සේ ආදම් සහ ඒවට කිවේ ඇයි ?

4. කෙනෙකු මිය ගිය විට ඔහුට වන්නේ කුමක් ද කියා බයිබලය මගින් දක්වන්න.

5. බයිබලයට අනුව මරණින් පසු අපට ඇති බලාපොරොත්තු මොනවාද?

6. ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පැමිණීමෙන් පසු මරණින් ඔසවා ගනු ලබන්නේ කවුරුන්ද ?

7. ක්‍රිස්තුස් වහන්සේ පැමිණියාට පසු දෙවියන් වහන්සේගේ ගැලවීමේ මාර්ගය නොදත් අය හට කුමක් සිදුවේද?

8. නැවත නැගිටීමෙන් පසු විශ්වාසිකයන්ගේ තත්වය පැහැදිලි කරන්න.

9. "නිරය" ගැන කථා කිරීමේ දී යේසුස් වහන්සේ පවසන්නේ කුමක් ද?

10. පොහොසත් මිනිසා සහ ලාසරස් නැමැති උපමාවෙන් අපට ගත හැකි පාඩම් මොනවාද?

11. දෙවියන් වහන්සේ උන්වහන්සේ හට විශ්වාසවන්තවූවන්ට පොරොන්දු වන්නේ කුමක්ද?